සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

30306

## 7 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ........................................................................ කාලය : පැය 02යි.

- පළමු කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

### I කොටස

- නිවැරැදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) යුප්‍රටීස් ටයිග්‍රීස් ගංගාව පිහිටි ප්‍රදේශය වර්තමානයේ හඳුන්වන්නේ,
1. ඉරාකය නමිනි.
2. ඊජිප්තුව නමිනි.
3. පාකිස්ථානය නමිනි.
4. චීනය නමිනි.

(02) නූතන ලෝකයේ ප්‍රචලිත ආණ්ඩු ක්‍රමයක් වන ප්‍රජාතන්ත්‍රවාදයේ මුල් බිම ලෙස සැලකෙන්නේ,
1. ඉන්දියාවේ මගධ රාජ්‍යයයි.
2. රෝමයේ වතිකානු රාජ්‍යයයි.
3. ග්‍රීසියේ පෞර රාජ්‍යයයි.
4. එක්සත් රාජධානියයි.

(03) වෛදික යුගයේ භරත ගෝත්‍රිකයින්ගේ කේන්ද්‍රස්ථානය වූයේ කවර ගංගා නිම්නය ද?
1. ඉන්දු ගංගා නිම්නයයි.
2. ගංගා නම් ගංගා නිම්නයයි.
3. සරස්වතී ගංගා නිම්නයයි.
4. කාවේරි ගංගා නිම්නයයි.

(04) ශ්‍රී පාදස්ථානයේ නඩත්තුව සඳහා "ගිලීමලේ" නම් ගම පූජා කළ රජතුමා,
1. පළමු වැනි විජයබාහු රජතුමාය.
2. මහා පරාක්‍රමබාහු රජතුමාය.
3. නිශ්ශංකමල්ල රජතුමාය.
4. දුටුගැමුණු රජතුමාය.

(05) ක්‍රිස්තියානි ධර්මය රෝම අධිරාජ්‍යය තුළ නීත්‍යානුකූල ආගම බවට පත් කරන ලද්දේ මින් කවර අධිරාජ්‍යයා විසින් ද?
1. ඔගස්ටස් සීසර් අධිරාජ්‍යයාය.
2. ජුලියස් සීසර් අධිරාජ්‍යයාය.
3. ජස්ටිනියන් අධිරාජ්‍යයාය.
4. කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යයාය.

(06) ග්‍රීකයන් ඇදහූ දෙවිවරුන් අතර විශ්වයට අධිපති දෙවියන් ලෙස සැළකුවේ,
1. හර්කියුලීස් ය.
2. සියුස් ය.
3. ටයිටැන් ය.
4. ඇපලෝ ය.

(07) ග්‍රීසිය විවිධ දාර්ශනිකයින් හා විද්‍යාඥයින් රැසක් ලොවට දායාද කර ඇත. ඒ අය අතරින් විද්‍යාඥයින් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. ඩිමොක්‍රිටස් ,හෙරඩෝටස්,ආකිමිඩීස්,පයිතගරස්
2. ආකිමිඩීස්, හිපොක්‍රටීස්, පයිතගරස් , යුක්ලිඩ්
3. ආකිමිඩීස්,හෙරඩෝටස්, පයිතගරස්,යුක්ලීඩ්
4. ඩිමොක්‍රිටස්,ප්ලේටෝ,ඇරිස්ටෝටල්,ආකිමිඩීස්

(08) සොළොස් මහා ජනපද අතරින් සමූහාණ්ඩු පාලනයක් පැවති වජ්ජි ජනපදයේ අගනුවර වූයේ,
1. සැවැත් නුවරයි.
2. විශාලා නුවරයි.
3. කොසඹෑ නුවරයි.
4. රජගහ නුවරයි.

(09) ක්‍රි.ව. 998 දී දකුණු ඉන්දියාවේ සිට චෝල හමුදාවක් සමඟ පැමිණ ලංකාවේ පාලනය ලබාගත් ආක්‍රමණිකයා,

1. කාලිංග මාඝ ය.
2. පළමු වැනි රාජ රාජ රජතුමා ය.
3. එළාර රජතුමා ය.
4. පළමු වැනි රාජේන්ද්‍ර රජතුමා ය.

(10) ශ්‍රී ලංකාවේ පැරණිම සන්දේශ කාව්‍යයන් ලෙස සැලකෙන මයුර හා තිසර සන්දේශ ලියැවුණේ මින් කවර යුගයක දී ද?

1. පොළොන්නරු යුගයේ දී ය.
2. දඹදෙණි යුගයේ දී ය.
3. ගම්පොළ යුගයේ දී ය.
4. කෝට්ටේ යුගයේදී ය.

(11) පහත "අ" තීරුව හා "ආ" තීරුව සමඟ ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. නිශ්ශංකමල්ල රජතුමා | - | A ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම |
| 2. හයවැනි පරාක්‍රමබාහු රජතුමා | - | B බෙලිගල දළදා මැඳුරක් ඉදි කිරීම |
| 3. දෙවැනි පරාක්‍රමබාහු රජතුමා | - | C කාලිංග මාඝ පරාජය කිරීම |
| 4. තුන්වැනි විජයබාහු රජතුමා | - | D ගල්පොත ශිලා ලිපිය |

1. ABCD 2. DACB 3. CDAB 4. ACBD

(12) පහත "අ" තීරුව හා "ආ" තීරුව සමඟ ගළපා නිවැරදි පිළිතුර තෝරන්න.

| "අ" | | "ආ" |
|---|---|---|
| 1. යාපහුව | - | A සංඛ සෙන්පති |
| 2. ගෝවින්ද මලය | - | B විජයබාහු කුමරු |
| 3. මිනිපේ | - | C බුවනෙකබාහු ආදිපාද |
| 4. දඹදෙණිය | - | D සුභ සෙන්පති |

1. DCBA 2. DCAB 3. ABCD 4. BDAC

(13) මුවදෙව්දාවත, සසදාවත, යන කෘති රචනා කිරීමට අනුග්‍රහ දැක් වූ පොළොන්නරු රාජිනිය වූයේ,

1. ලීලාවතී රජිනයි.
2. අනුලා දේවියයි.
3. සුගලා දේවියයි.
4. කල්‍යාණවතී දේවියයි.

(14) ගම්පළ රාජධානි සමයට අයත් ඓතිහාසික සිද්ධස්ථාන දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. රන්කොත් විහාරය හා අවුකන විහාරය.
2. ලංකා තිලකය හා ගඩලාදෙණි විහාරය.
3. ඇම්බැක්කේ දේවාලය හා රන්කොත් විහාරය.
4. ගඩලාදෙණි විහාරය හා උත්තරාරාම.

(15) කෝට්ටේ යුගයේ දී හය වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් සිය මව සිහිවීම පිණිස ඉදි කරන ලද පිරිවෙනකි,

1. පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන.
2. පැපිලියානේ සුනේත්‍රා දේවි පිරිවෙන.
3. කැරගල පද්මාවතී පිරිවෙන.
4. තොටගමුවේ විජයබා පිරිවෙන.

(16) අවුකන හා තොලුවිල යන බුද්ධ ප්‍රතිමා නිර්මාණය වී ඇත්තේ කුමන ඉන්දියානු සම්ප්‍රදායක් මුල් කරගෙන ද?

1. ගුප්ත සම්ප්‍රදාය.
2. පල්ලව සම්ප්‍රදාය.
3. අමරාවතී සම්ප්‍රදාය.
4. චෝල සම්ප්‍රදාය.

(17) තෝපා වැව, එරබඳු වැව, දුඹුටුළු වැව,ඒකාබද්ධ කොට ගොඩ නැංවුණු සුවිශාල වාරි පද්ධතියක් වූයේ,

1. මින්නේරි වැවයි.
2. නිශ්ශංක සමුද්‍රයයි.
3. පරාක්‍රම සමුද්‍රයයි.
4. කන්තලේ වැවයි.

(18) පොළොන්නරු රාජධානිය බිඳවැටීමට ආසන්නතම හේතුව වූයේ,
1. අභ්‍යන්තර දේශපාලන බල අරගලයි.
2. රටේ නායකත්වය අතර වූ අසමගියයි.
3. රටේ නායකයන් අදූරදර්ශී වීමයි.
4. කාලිංග මාඝගේ ආක්‍රමණයයි.

(19) වසූරිය රෝගය මුලින් ම හඳුනාගත් අරාබි ජාතිකයා වූයේ,
1. ඉබන් බතුතා ය.
2. අල් -රාසි ය
3. අල් - හිදාස් ය.
4. ඕමාර් කයියාම් ය.

(20) යාල්පාන වෛපවමාලෙ නම් කෘතියේ සඳහන් අන්දමට යාපන රාජ්‍යයේ ආරම්භක රජතුමා වූයේ,
1. පරරාජසේකරම් රජු ය.
2. විජය කුලංකෛ රජු ය.
3. වරෝදය රජු ය.
4. සංකිලි රජු ය.

## II කොටස

- පළමු වැනි ප්‍රශ්නය අනිවාර්යය වේ.
- පළමු වැනි ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) පාසල පදනම් කරගත් ඇගයීම් යටතේ තෙවැනි පාසල් වාරයේ දී ඔබ පන්ති කාමරය තුළ සිදු කළ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) මෙම ඇගයීමේ දී ඔබ කණ්ඩායමට ප්‍රශ්න සැකසීමට පවරන ලද පාඩමේ මාතෘකාව නම් කරන්න. (ල. 2)

(ii) මෙම ඇගයීම සඳහා ප්‍රශ්න සකසන ආකාරය පිළිබඳව ගුරුතුමිය/ ගුරුතුමා ඔබට ලබා දුන් උපදෙස් දෙකක් ලියන්න. (ල. 2)

(iii) මෙම වැඩසටහන පැවැත්වීමට ඔබ හා ඔබේ පන්තියේ සිසුන් සංවිධානය වූ අයුරු කෙටියෙන් ලියන්න. (ල. 4 )

(iv) ඔබ කණ්ඩායමට පැවරුණු එක් මාතෘකාවකට අනුකූලව ඔබ විසින් සකස් කළ ප්‍රශ්න දෙකක් හා ඊට අදාළ පිළිතුරු දෙකක් ලියන්න. (ල. 4)

මෙම ඇගයීම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ල. 4)

(02) (i) ඉපැරණි ශිෂ්ටාචාර ගංගා නිම්න ආශ්‍රිතව බිහිවීමට බල පෑ හේතු දෙකක් ලියන්න. (ල. 2)

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ නාගරික ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ල. 4)

(iii) චීනයේ හොවැංහෝ නදී නිම්න ශිෂ්ටාචාරයේ ආර්ථික රටාවේ කැපී පෙනුණු ලක්ෂණ දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

(03) (i) ක්‍රිස්තියානි ආගමේ චිරජීවනය පෙරදැරි කරගෙන සිදු කළ යුද මාලාව හැඳින්වූයේ කුමන නමකින් ද? (ල. 1)

(ii) එම යුද්ධය අවසානයේ කිතුනුවන්ට අහිමි වී ගිය ශුද්ධ වූ භූමිය සඳහන් කරන්න. (ල. 1)


(iii) එය සිදු වූයේ කුමන වර්ෂයේ ද? (ල.1)

(iv) මෙකී යුද්ධයේ ප්‍රතිඵල දෙකක් කෙටියෙන් ලියන්න. (ල. 4)

(v) මෙම යුද්ධය අවසන් වන විට පෙරදිග තිබූ දැනුම හා නිෂ්පාදන යුරෝපයට ගෙන ගිය බව කියවේ. එසේ ගෙන ගිය දායාදයන් දෙකක් හා නිෂ්පාදන දෙකක් නම් කරන්න. (ල. 4)

(04) (i) රෝම අධිරාජ්‍යයට එල්ල වූ ගෝත්‍රික ආක්‍රමණ දෙකක් ලියන්න. (ල. 2)

(ii) රෝම ගෘහ නිර්මාණ ශිල්පය විදහා පාන මෙම ගොඩනැගිල්ල හඳුන්වන්නේ කවර නමකින් ද? (ල.1)



(iii) මේ හැරුණු විට රෝම ගෘහ නිර්මාණ ශිල්පය විදහාපාන අමරණීය නිමැවුම් තුනක් ලියන්න. (ල.3)

(iv) වැඩවසම් ක්‍රමයේ පරිහානියට මුල් වූ කරුණු දෙකක් ලියා ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ල.5)

(05) (i) ශ්‍රී ලංකාව හා දකුණු ඉන්දියාව අතර පැවති සම්බන්ධතා දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ii) අනුරාධපුර රාජධානියට ආක්‍රමණ එල්ල කළ දකුණු ඉන්දීය රාජ්‍ය හතරක් නම් කරන්න. (ල.4)

(iii) අනුරාධපුර රාජධානියේ පිරිහීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ල. 5)


(06) (i) පළමු වැනි විජයබාහු රජතුමා විදේශ සබඳතා ඇති කොටගත් රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) පොළොන්නරු රාජධානිය හැඳින්වූ වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 2)

(iii) විජයබාහු රජතුමාගෙන් ඉටු වූ සේවා එක බැගින් පහත සඳහන් මාතෘකා යටතේ ලියන්න.

i. දේශපාලන සේවාවක් -
ii. ආගමික සේවාවක් -
iii. සංස්කෘතික සේවාවක් - (ල. 3)

(iv) දී ඇති ලංකා සිතියමේ A, B, C, D යන ස්ථාන නාම අනුපිළිවෙළින් නම් කරන්න. (ල. 4)




(07) (i) විජයබා කොල්ලයෙන් පසුව කෝට්ටේ රාජධානිය කොටස් තුනකට කැඩී ගියේය. ඉන් දෙකක් නම් කරන්න. (ල. 2)

(ii) කෝට්ටේ යුගයේ ලියැවුණු සන්දේශ කාව්‍ය දෙකක් නම් කරන්න (ල. 4)

(iii) ශ්‍රී ලංකාව එක්සේසත් කිරීම සඳහා කෝට්ටේ හය වැනි පරාක්‍රමබාහු රජතුමා විසින් ඉටු කරන ලද සේවා දෙකක් විස්තර කරන්න. (ල .5)